**දෙහිඕවිට ප්‍රාදේශීය සභාව - 2020**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරනලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයනලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) පනතේ 6(1)(ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) පනතේ 6(1)(ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේදී ඉඩම් හා ගොඩනැගිලි තක්සේරුකර තිබුණද එම තක්සේරු වාර්තාව සභාව විසින් අනුමත නොකර නැවත තක්සේරු කිරීම සඳහා වෙනත් කමිටුවක් පත්කර තිබියදී ඉහත තක්සේරුව මත වැඩි වූ වටිනාකම රු.168,119,089 ක් ප්‍රාග්ධනිත කර තිබුණි. | 2019 වර්ෂයේදී කල ඉඩම් තක්සේරු වටිනාකම අතපසුවීමකින් ප්‍රාග්ධනිත කර ඇති අතර ඉදිරියේදී සත්‍යාපක්ෂණ වාර්තාව සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | නිවැරදි ක්‍රමවේදය අනුගමනය කර වත්කම් ප්‍රාග්ධනිත කල යුතුයි. |
| (ආ) | පරිත්‍යාග වශයෙන් ලැබී ඇති යන්ත්‍ර 11ක පිරිවැය හඳුනාගෙන ප්‍රාග්ධනිත කර නොතිබුණි. | මිල කමිටුවක් මඟින් වටිනාකම හඳුනාගෙන ඇති අතර ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | පරිත්‍යාගවල පිරිවැය වටිනාකම ප්‍රාග්ධනිත කල යුතුයි |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් ලී බඩු හා සවි කිරීම් වෙනුවෙන් ලද වට්ටම් රු.111,314 ක් ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ලී බඩු හා සවි කිරීම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම වැඩියෙන් දක්වා තිබුණි. | ලී බඩු වෙනුවෙන් ලද වට්ටම ප්‍රාග්ධනිත කලයුතු බැවින් ලී බඩු සහ සවිකිරීම් ගිණුමට හා ප්‍රාග්ධන යෙදුමට ආධාර මඟින් දායකවීමේ ගිණුමට ගැලපීම් කිරීම් නිවැරදි සටහනක් බව දන්වා තිබුණි. | වෙළඳ වට්ටම් ගිණුම් තැබීමක් සිදුනොවේ වත්කම මිලදී ගැනීමට ගෙවූ මුදල වත්කමේ පිරිවැය ලෙස ගිණුම් තැබිය යුතුයි. |
| (ඈ) | ඉඩමක් කට්ටි කිරීමෙන් ලැබිය යුතු සියයට එකක මුදල වූ රු.145,290 ක් ණයගැතියෝ ලෙස ගිණුම්ගතකර නොතිබුණි. | මේ සඳහා ණය ගැති ප්‍රතිපාදන වෙන්කිරීමට අතපසුවී ඇති බවත් එම මුදල හඳුනාගෙන ගිණුම් ගත කරනු ලබන බවත් දන්වා තිබුණි. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුයි. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයකට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. 298,857 ක් හා අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. 206,016 ක් වූයෙන් රු. 92,841 ක වෙනසක් විය | වෙනස්කම් හදුනාගෙන ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | ගිණුම් සැසඳීමට කටයුතු කර නිවැරදි කර ගත යුතුයි. |

### 1.7 අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 185 | සභාපතිවරයාගේ අනුමැතිය මත සිදුකරන ලද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.27,479,853 ක් වටිනාකමැති ආයෝජන සඳහා සභා අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මේ සඳහා අනුමැතිය ලබාගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | ආයෝජනය කිරීමේදී රීති ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571(3) | 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලයට අදාල කල් ඉකුත් වූ රු.1,262,535 ක ඇප තැන්පතු සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | දෙහිඕවිට නව වෙළඳ සංකීර්ණයට අදාලව ගිවිසුම්ගතවීම සිදුවන තෙක් එම ගිවිසුම් ඇප තැන්පත් මුදල් රඳවාගෙන ඇති බව දන්වා තිබුණි. | ගිවිසුම් ගත වීම සිදුකල වහාම මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| (ඇ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනතේ සේවා නියුක්ති ආදායම යටතේ උපයනවිට බදු ගෙවීම් අංක 07 | ද්විතීය සේවයෙන් ලබා ගන්නා ලද ආදායම රු.50,000 ට අඩු වන විට ආදායමෙන් සියයට 10 ක්ද රු. 50,000 ට වැඩිවන ඕනෑම වටිනාකමකට සියයට 20 ක් බැගින් උපයනවිට බදු ගෙවීම කළ යුතු වුවද, ප්‍රාදේශීය සභාවේ සේවය කරන මන්ත්‍රීවරුන් දෙදෙනෙක් සඳහා 2019 නොවැම්බර් දක්වා ගෙවන ලද රු.841,044 ක් වෙනුවෙන් රු.84,104 ක බදු අයකර නොතිබුණි. | මේ පිළිබඳව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් විමසා ඉදිරි කටයුතු කරන බව දන්වා තිබුණි. | දේශීය ආදායම් බදු පනත ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ පුනරාවර්තන ආදායම රු.1,340,388 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.2,865,210 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් හා බදු ශේෂය රු. 3,657,006 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | තෝරාගත් කොට්ඨාශ කිහිපයක හිඟ වරිපනම් සඳහා දේපල තහනම් කිරීමට රතු නිවේදන නිකුත් කර ඇතත් වසංගත තත්ත්වය නිසා එය ක්‍රියාත්මක කල නොහැකි වූ බවත් ලිපි මාර්ගයෙන් හා නිලධාරීන් ගෙයින් ගෙට ගොස් ආදායම් එකතු කිරීම සිදු කරනු ලබන බවත් දන්වා තිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කර හිඟ ආදායම් අයකර ගත යුතුයි. |
| (ආ) | කුලී | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කුලී ශේෂය රු. 2,919,057ක් පැවතුණි. | හිඟ කුලීවල කීමනි මුදල වාරික 12 කින් අයකර ගැනීමටත් ඉතිරි හිඟ මුදල ගෙවන ලෙස කඩ හිමියන් වෙත ලිපි නිකුත් කර අයකරගනිමින් පවතින බවත් දන්වා තිබුණි. | හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |
| (ඇ) | උසාවි දඩ | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ ශේෂයෙන් රු. 2,164,373ක් වර්ෂ දෙකක කාලයක් ඉක්මවා තිබුණද අයවී නොතිබුණි. | වර්ෂ 2 ක කාලයක් ඉක්මවා ඇති ශේෂය සංශෝධනය කිරීම පමණක් දක්වා තිබුණි. | අයවිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කර්මාන්ත ණයගැති ශේෂය රු.81,529,088 ක් හා ගෙවියයුතු කර්මාන්ත ණයහිමි ශේෂය රු. 91,786,151 ක් විය. | දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලිපි යවා ඇති අතර අදාල සංවර්ධන ව්‍යාපෘති සඳහා මුදල් ලද පසුව ගෙවීම් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් කර ගත යුතුයි. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවේ හෙළ බොජුන්හල ඉදිකිරීමේදී වැඩ අවසන් කල කොටස් සඳහා රු.929,966 ක් 2020 අගෝස්තු 28 දින ගෙවා තිබුණද වැසිකිළිය ඉදිකිරීමට අදාල වැඩ කොටස් නිම නොකිරීම හේතුවෙන් විගණන දිනය වූ 2020 ඔක්තෝබර් 05 දක්වාත් විවෘත කිරීමට නොහැකිවී තිබුණි. එමෙන්ම ඇස්තමේන්තුවේ නොතිබුණු ගබඩා කාමරයක් සඳහා ඉඩ වෙන්කර දොරක් යොදා තිබීම නිරීක්ෂණය වූ අතර ආරක්ෂිත වැටක් නොතිබීම හේතුවෙන් පරිශ්‍රයේ උපාංග අනාරක්ෂිතව පැවතුණි. | ඇස්තමේන්තු අයිතම 31 ක පමණක් වැඩ අවසන් කර ඒ සඳහා ගෙවීම් කර ඇත.පළමු කොන්ත්‍රාත්කරුගේ ඇස්තමේන්තුව තුල වැසිකිළි පද්ධතිය ඉදිකිරීම ඇතුලත්ව තිබුනද එය ඉටුනොවීම හේතුවෙන් 2020 සැප්තැම්බර් 08 නැවත ඇස්තමේන්තුවක් අනුමත කර ඇති බවත් වැසිකිළි 2 ක් සකස් කිරීමට එම ස්ථානය සකස් කර තිබුණද ගබඩාවක් නොමැති නිසා එය ගබඩාවට ගෙන වැසිකිළිය වෙනම ස්ථානයක සකස් කිරීමට තීරණය වී ඇති බවත් දෙවන ඇස්තමේන්තුව අනුව උපකරණ ආරක්ෂා කිරීමට දොරවල් සවිකිරීමට කටයුතු සලසා ඇති බවත් දන්වා තිබුණි. | හෙළ බොජුන්හල ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කල යුතු අතර වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීමටද කටයුතු කල යුතුයි. |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු බැකෝ යන්ත්‍රය සේවයේ යෙදවීමේ දී මුදල් අයකර හා නොකර සැපයීම සිදු කර තිබූ අතර නොමිලයේ ලබාදීම සභාපතිවරයාගේ අනුමැතිය යටතේ සිදුවී තිබුණි. 2019 වර්ෂයේ සිට 2020 අගෝස්තු දක්වා නොමිලයේ සැපයූ මීටර් පැය ගණන 1026.70 ක් වූ අතර ඒ තුලින් සභාවට අහිමි වී ඇති ආදායම දල වශයෙන් රු.1,613,550 ක් විය. මුදලට සැපයීමෙන් උපයාගත් ආදායම රු.808,950 ක් වුවද යන්ත්‍රයේ ඉන්ධන හා අළුත්වැඩියා සඳහා දැරීමට සිදුවූ පිරිවැය පිළිවෙලින් රු.1,362,989 ක් හා රු. 1,444,103 ක් විය. | 2019 වර්ෂයේදී ප්‍රතිපාදන වෙන්කර නොතිබීම නිසා නොමිලේ සිදුකරන ලද සේවාවන් ආදායමට ගෙන නැති අතර 2020 ජනවාරි සිට ජූනි දක්වා කරන ලද පොදු සේවාවන් සඳහා වැයවූ වියදම ආදායමට ගැනීමට කටයුතු කර ඇති බව දන්වා තිබුණි. | සභාවේ වත්කම් සේවයේ යෙදවීමෙන් ලබාගත හැකි ආදායම් උපයාගැනීමට කටයුතු කල යුතුයි. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආදායම් පරීක්ෂක හා රියදුරු තනතුරුවල අනුමත සංඛ්‍යාව 03 බැගින් වුවද තථ්‍ය සංඛ්‍යාව පිළිවෙලින් 1ක් හා 2ක් විය. පුරප්පාඩු සඳහා එම තනතුරුවල වගකීම් දැරිය නොහැකි වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් දෙදෙනෙකු ආදායම් එකතු කිරීමේ රාජකාරීවලද, හතරදෙනෙකු රියදුරු තනතුරේද අනුයුක්ත කර තිබුණි. එමෙන්ම තෘතීයික මට්ටමේ එක් තනතුරක්ද, ද්විතීයික මට්ටමේ තනතුරු 05 ක පුරප්පාඩු 13 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 05 ක පුරප්පාඩු 09 ක් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආදායම් පරීක්ෂක හා රියදුරු තනතුරේ අනුමත සංඛ්‍යාව නොමැති බැවින් පුරප්පාඩු සම්පූර්ණ කර දෙන ලෙස ප්‍රධාන ලේකම් වෙත ලිඛිත ඉල්ලීම් කර ඇති අතර රියදුරු බලපත්‍ර සහිත වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරේ සේවයේ නියුතු සේවකයන් රියදුරු රාජකාරීවල යොදවා ඇතිබවත් තෘතීයික, ද්විතියික, ප්‍රාථමික යන තනතුරු සඳහා ඇති සියළුම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට ප්‍රධාන ලේකම් වෙත ලිඛිත ඉල්ලීම් කර ඇති බවත් දන්වා තිබුණි. | සභාවේ පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කල යුතුයි. |